# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2465/05 - 2025 දෙසැම්බර් මස 01 වැනි සඳුදා - 2025.12.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1973 අංක 25 දරන ක්‍රීඩා පනත**

සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග

01\. තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය සුනිල් කුමාර ගමගේ වන මම, සංශෝධිත 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමග කියවිය යුතු 41 වගන්තිය යටතේ තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2025.05.21 දිනැතිව අංක 2437/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරමි.

02\. 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන්හි 6 වන නියෝගයෙහි (8) උපවගන්තිය ඉවත් කරනු ලැබේ.

03\. 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන්හි 6 වන නියෝගයෙහි (10) උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(10) නාමයෝජනා ඉදිරිපත් කිරීමට පෙර වසර දෙකක කාල සීමාව තුළ දී ක්‍රීඩාවට අදාළ ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩාවට අදාළ වෙනත් යම් අයිතම හෝ උපකරණ හෝ ශක්ති වර්ධනය සඳහා වූ ආහාර ද්‍රව්‍ය ජාතික ක්‍රීඩා සංගමයකට/ සම්මේලනයකට හෝ වෙනත් යම් ආයතනයකට අලෙවි කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ හෝ සැපයීමේ යෙදී ඇත්නම් හෝ වාණිජ අරමුණු සහිතව අදාළ ක්‍රීඩාවට සම්බන්ධ සේවා සැපයීමේ යෙදී ඇත්නම්;

04\. 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන්හි 10A වන නියෝගය වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**පැරාලිම්පික් ක්‍රීඩා**

*10A.*

(1) පැරාලිම්පික් ක්‍රීඩාවන්ට අදාළව ආබාධ සහිත පුද්ගලයින්ගේ ක්‍රීඩා සඳහා වූ (දෘශ්‍යාබාධිත, ශ්‍රව්‍යාබාධිත, කායික ආබාධිත යනාදී) සියලුම අනුබද්ධ ක්‍රීඩා සමාජ පැරා ක්‍රීඩා සම්බන්ධ ජාතික සංගමයේ (ජාතික පැරාලිම්පික් කමිටුවේ) අනුබද්ධ ක්‍රීඩා සමාජ ලෙස නිසි පරිදි ලියාපදිංචි විය යුතු අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් ජාතික පැරාලිම්පික් කමිටුව විසින් සලසා දිය යුතු ය.

1A - G 45831 — 04 (2025/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) පැරාලිම්පික් ක්‍රීඩාවන්ට අදාළ නොවන අනෙකුත් සියලුම ක්‍රීඩාවන්ට අදාළ ආබාධ සහිත පුද්ගලයින්ගේ ක්‍රීඩා සඳහා වූ (දෘශ්‍යාබාධිත, ශ්‍රවණාබාධිත, කායික ආබාධිත යනාදී) අනුබද්ධ ක්‍රීඩා සමාජ එම ක්‍රීඩාවට අදාළ ජාතික සංගමයේ අනුබද්ධ ක්‍රීඩා සමාජ ලෙස නිසි පරිදි ලියාපදිංචි විය යුතු අතර ඒ සඳහා අවශ්‍ය පහසුකම් අදාළ ජාතික සංගමය විසින් සලසා දිය යුතු ය.

05. 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන්හි 12 වන නියෝගයෙහි (1) [VI] උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(VI) සෑම ජාතික ක්‍රීඩා සංගමයක්ම/සම්මේලනයක්ම ඒවායේ නිලවරණ කමිටුවේ සංයුතිය පහත පරිදි තෝරා පත් කරගත යුතුය;

(අ) **A ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලන** : විශ්‍රාමලත් මහාධිකරණ හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරුන් දෙදෙනෙක් සහ එකී ජාතික සංගමය හෝ එහි අනුබද්ධ ක්‍රීඩා සමාජ, වෙනත් යම් අනුබද්ධ සංවිධාන තුළ ක්‍රියාකාරී සාමාජිකයෙක් නොවන මැතිවරණ දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් විධායක ශ්‍රේණියේ රජයේ නිලධාරීන් දෙදෙනෙක්/ මැතිවරණ කොමිෂන් සභාවේ විශ්‍රාමලත් සාමාජිකයින් දෙදෙනෙක් හෝ නිලවරණ පැවැත්වීම පිළිබඳ පළපුරුද්දක් ඇති විශ්‍රාමලත් විධායක ශ්‍රේණියේ රජයේ නිලධාරීන් දෙදෙනෙක් සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන නියෝජිතයෙක්,

(ආ) **B ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන** : විශ්‍රාමලත් මහාධිකරණ හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙක් සහ එකී ජාතික සංගමය හෝ එහි අනුබද්ධ ක්‍රීඩා සමාජ, වෙනත් යම් අනුබද්ධ සංවිධාන තුළ ක්‍රියාකාරී සාමාජිකයෙක් නොවන මැතිවරණ දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් විධායක ශ්‍රේණියේ රජයේ නිලධාරියෙක් / මැතිවරණ කොමිෂන් සභාවේ විශ්‍රාමලත් සාමාජිකයෙක් හෝ නිලවරණ පැවැත්වීම පිළිබඳ පළපුරුද්දක් ඇති විශ්‍රාමලත් විධායක ශ්‍රේණියේ රජයේ නිලධාරියෙක් සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන නියෝජිතයෙක්.

(ඇ) **C ශ්‍රේණියේ ජාතික ක්‍රීඩා සංගම්/ සම්මේලන** : එකී ජාතික සංගමය හෝ එහි අනුබද්ධ ක්‍රීඩා සමාජ, වෙනත් යම් අනුබද්ධ සංවිධාන තුළ ක්‍රියාකාරී සාමාජිකයෙක් නොවන නිලවරණ පැවැත්වීම පිළිබඳ පළපුරුද්දක් ඇති විශ්‍රාමික රජයේ විධායක ශ්‍රේණියේ නිලධාරීන් දෙදෙනෙක් සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කරනු ලබන නියෝජිතයෙක්,
සමන්විත කමිටුවක් විය යුතුය.

06. 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන්හි 13 වන නියෝගයෙහි (05) උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(5) එකී අභියාචනය සනාථ කිරීම සඳහා අදාළ සියලු සාක්ෂි හා අනෙකුත් අවශ්‍ය කරුණු ද අමාත්‍යාංශයේ සරප් වෙත ගෙවන ලද ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් විසි පන්දහසක් (රු. 25,000/-) වූ ආපසු නොගෙවනු ලබන මුදල ගෙවූ බවට වන ලදු පතේ මුල් පිටපත ද එම අභියාචනය සමග ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත පිටපත් හතරක් (04) සහිතව ඉදිරිපත් කළ යුතු ය. අභියාචනා සඳහා ගෙවනු ලබන සියලු මුදල් ජාතික ක්‍රීඩා අරමුදල වෙත බැර කළ යුතුය.

07. 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන්හි 14 වන නියෝගයෙහි (23) උපවගන්තිය ලෙස පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(23) සෑම ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක සෑම විධායක කමිටු සාමාජිකයෙකුම 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ විධිවිධාන ප්‍රකාරව වත්කම් සහ බැරකම් ප්‍රකාශ ලබා දීම සිදු කළ යුතු ය. එලෙස වත්කම් සහ බැරකම් ප්‍රකාශ භාර දීමට අසමත්වන සහ/ හෝ පැහැර හරින අයෙකු ජාතික ක්‍රීඩා සංගමයක/ සම්මේලනයක කිසිදු නිලයක් සඳහා තේරී පත් වීමට සහ/ හෝ දැරීමට නුසුදුස්සකු වන්නේ ය.

08. 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන්හි 14 වන නියෝගයෙහි (25) උපවගන්තිය ලෙස පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(25) යම් පුද්ගලයෙකු ජාතික ක්‍රීඩා සම්මේලනයක නිලවරණයක් සඳහා නාමයෝජනා ඉදිරිපත් කරන දිනට සහ/හෝ ජාතික ක්‍රීඩා සම්මේලනයක විධායක කමිටුවේ ධුරයක් දරන අවස්ථාවේ දී අදාළ ක්‍රීඩාව සම්බන්ධයෙන් කුමන හෝ ආකාරයක ගෙවීමක් ලබන හෝ නොලබන උපදේශකයෙකු/ පුහුණුකරුවෙකු/ තාක්ෂණ නිලධාරියෙකු/ විනිශ්චයකරුවෙකු වන්නේ නම් අදාළ ජාතික ක්‍රීඩා සම්මේලනයේ විධායක කමිටු සාමාජිකත්වය සඳහා තෝරා පත්කර ගැනීමට හෝ විධායක කමිටු සාමාජිකත්වය දැරීමට හෝ විධායක කමිටු සාමාජිකත්වය සඳහා නාමිකයෙකු වීමට ඔහු හෝ ඇය නුසුදුස්සකු විය යුතු ය.

09. 2025 අංක 01 දරන ක්‍රීඩා සංගම් නියෝගයන්හි II වන උපලේඛනයේ ක්‍රීඩාවල නම් යටතේ ඇති "**37.ආබාධිතයන්ගේ ක්‍රීඩා** " වෙනුවට "**37. පැරාලිම්පික් ක්‍රීඩා**" ලෙස ඇතුළත් කිරීමෙන් II වන උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**සුනිල් කුමාර ගමගේ (පා.ම.),**
තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය.

2025 නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 - 0006

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.